# ජපන් තැපැල් බැංකුව සමඟ ගණුදෙනු කරන විදේශීය ගණුදෙනුකරුවන් සඳහා

■ <u>ගිණුමක් විවෘත කිරීමේදී සහ විවිධ ක්‍රියා පටිපාටි සිදු කිරීමේදී, කරුණාකර ඔබගේ පුරවැසිභාවය・ පදිංචියේ ස්වභාවය・ ජපානයේ රැඳී සිටින කාලය යනාදිය තහවුරු කිරීම සඳහා ඔබගේ පදිංචි කාඩ්පත නිලදාරීන්ට ඉදිරිපත් කරන්න.</u>

※ පදිංචි කාඩ්පත යාවත්කාලීන කර ඇත්නම්, ක්‍රියා පටිපාටි සිදු කරන විට ඒ බව දන්වන්න.

※ රාජ්‍ය තාන්ත්‍රිකයන් යනාදී පදිංචි කාඩ්පත් නිකුත් කර නොමැති පුද්ගලයන් පදිංචි කාඩ්පත ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

■ <u>ගිණුමක් විවෘත කිරීමට අයදුම් කල දින සිට මාස 3ක් ඇතුළත ඔබගේ පදිංචි කාලය අවසන් වන්නේ නම්, ඔබට ගිණුමක් විවෘත කල නොහැකි වේ.</u>

ජපානයේ දිගටම රැඳී සිටීමට බලාපොරොත්තු වන ගණුදෙනුකරුවන්, පදිංචි කාලය යාවත්කාලීන කල පසු නව පදිංචි කාඩ්පත රැගෙනවිත් ගිණුමක් විවෘත කිරීමට අයදුම් කරන්න.

※ ජපානයට පැමිණෙන විට ඔබගේ රැඳී සිටීමේ කාලය මාස 3කට අඩු, පදිංචි කාඩ්පතක් නිකුත් කර නොමැති පුද්ගලයින්ට,
ජපන් තැපැල් බැංකුවකින්・තැපැල් කාර්යාලයකින් ගිණුමක් විවෘත කල නොහැක.

※ පදිංචි තත්වය・පදිංචි කාලය යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියක නිරත වෙමින් සිටින පුද්ගලයන්, යාවත්කාලීන කිරීමෙන් පසු නව පදිංචි කාඩ්පත රැගෙන පැමිණෙන්න.

■ <u>කරුණාකර ඔබගේ ශිෂ්‍ය හැඳුනුම්පත・ සේවක හැඳුනුම්පත ඉදිරිපත් කරන්න.</u>

පදිංචි තත්වය 「留学 (ශිෂ්‍ය)・「技能実習 (තාක්ෂණික සීමාවාසික පුහුණුව) 」වන පුද්ගලයන්, පාසල් යන බව සහ සමාගමක සේවය කරන බව තහවුරු කිරීම සඳහා තම පදිංචි කාඩ්පත සමඟ ශිෂ්‍ය හැඳුනුම්පත , සේවක හැඳුනුම්පත ආදිය නිලදාරීන්ට ඉදිරිපත් කරන්න.

※ ජපන් තැපැල් බැංකුව・තැපැල් කාර්යාලය මඟින් ඔබගේ පාසලට හෝ සමාගමට දුරකතන ඇමතුම් ලැබිය හැක.

■ <u>ගිණුමක් විවෘත කිරීම සඳහා යම් කාලයක් ගතවිය හැක.</u>

අදාළ නීති රෙගුලාසි මත පදනම්ව විවිධ තහවුරු කිරීම් සිදු කරන බැවින්, අයදුම් කරනු ලබන දිනම ගිණුමක් විවෘත කිරීමට නොහැකි වූ විට, පසු දිනයක පාස්පොත ගණුදෙනුකරුගේ නිවසට තැපැල් මඟින් එවනු ලබන අවස්ථාද පවතී.

■ <u>සැලකිලිමත් විය යුතු වෙනත් කරුණු</u>

- අප, ඔබ විසින් ඉදිරිපත් කරන සහතිකවල පිටපත් තබා ගන්නෙමු.
- **<u>ඔබගේ ලිපිනය හෝ නම වෙනස් වීම, පදිංචි කාඩ්පත යාවත්කාලීන වීම වැනි අවස්ථාවක, හැකි ඉක්මනින් යාවත්කාලීන වූ පදිංචි කාඩ්පත රැගෙනවිත් කවුන්ටරයේදී අවශ්‍ය ක්‍රියා පටිපාටි සිදු කරන්න.</u>**
- **<u>ඔබ විසින් එලෙස දැනුම්දීමක් සිදු නොකරන්නේ නම්, තාවකාලිකව ගණුදෙනු සීමා විය හැක.</u>**
- අනේවාසිකයෙකු ලෙස ලියාපදිංචි වී ඇති පුද්ගලයන්, පදිංචිකරුවකු ලෙස තම පදිංචි තත්වය වෙනස් වූ අවස්ථාවක හැකි ඉක්මනින් කවුන්ටරය වෙත දැනුම් දෙන්න.
- **<u>තම රටට නැවත යන විට හෝ ජපානයෙන් පිටත වෙනත් රටක පදිංචියට යන විට, ගිණුම අවලංගු කිරීමට වග බලාගන්න.</u>**
- තෙවන පාර්ශවයකට භාවිතා කිරීමේ අරමුණ මත **<u>ගිණුමක් (පාස් පොත・කාඩ්පත) හුවමාරු කිරීම, අලෙවි කිරීම හෝ මිලදී ගැනීම අපරාධයකි. කිසිසේත්ම නොකරන්න.</u>**

ඉදිරිපස




පිටුපස




මූලාශ්‍රය : ආගමන විගමන දෙපාර්තමේන්තු වෙබ් අඩවිය

【改正年月日:2024.10.1】